ශ්‍රී බුද්ධ වර්ෂ 2553 - 2554

රාජ්‍ය වර්ෂ 2010



# බුදුසරණ

## දෙලොස් මහා පොහොය දිනවල සිදු වූ ශාසනික වශයෙන් වැදගත් ඓතිහාසික සිදුවීම්

**දුරුතු පසළොස්වක පොහොය**
තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ ගේ ප්‍රථම ලංකා ගමනය සිදු වූයේ ඓතිහාසික දුරුතු පෝ දිනකය. තුන්බෑ ජටිලයන් ප්‍රධාන දහසක් සච්චන් සදහම් මඟට හරවා ඔවුන් හැම අරි සඟ ගණ බවට පත්කොට වදාළ බුදුපියාණන් වහන්සේ අනතුරුව හෙළදිව බිම්තැන්නේ මහවැලි ගඟ අසබඩ මිනිපේ නම් සරුදනව් පියසට ගුවන් ගැබින් පහළව සවනක් බුදු රැස් මාලාවන්ගෙන් දිලිහී වැඩහුන් සේක.

**නවම් පසළොස්වක පොහොය**
සැරියුත් මුගලන් දෙනම අගසව් තනතුරු ලබන ලද්දේ ද, සම්බුද්ධ ශාසනවංශ කථාවෙහි ප්‍රථම මහා සංඝ සන්නිපාතය සිදු වූයේ ද නවම් පුණු පොහෝ දිනකය.

**මැදින් පසළොස්වක පොහොය**
ලෝකාර්ථචර්යාවෙහි යෙදුණු බුදුන් වහන්සේ විසි දහසක් මහ සඟරුවන සමඟ රජගහනුවර සිට තමන් වහන්සේගේ උපන් ගම වූ කිඹුල්වත්පුරයට ගමනාරම්භ කළේ මැදින් පෝදකය.

**බක් පසළොස්වක පොහොය**
බුදුපියාණන් වහන්සේගේ මහා ගුණකඳ මනසට නංවන අසිරිමත් දිනයකි. බක් පොහොය දිනය. මේ සුන්දර දිවයින තෙවැනි වරට ද බුදු සිරිපා පහසින් පිවිතුරු බවට පත් වූයේ ද, බුදුරජාණන් වහන්සේගේ සවනක් රැස් කදින් නාගදීපය ආලෝකවත් වූයේ ද දහම් අමා මිහිරෙන් නොයෙක් දෙනා නිවී සැනසී ගියේ ද, බක් පුර පොහෝ දිනකදී ය.

**වෙසක් පසළොස්වක පොහොය**
තිලොවග සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ලොව පහළවීම බුදුවීම, පිරිනිවන් පෑම යන අසිරිමත් මංගල කරුණු රැසකින් පූජනීයත්වයට, ඓතිහාසිකත්වයට පත් වුණු ශ්‍රී වෛශාඛ දිනය සමස්ත ලෝකවාසී බෞද්ධ ජනතාවගේ පරම පූජනීය දිනයයි.

**පොසොන් පසළොස්වක පොහොය**
අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේ දඹදිව් තලයේ සිට හෙළදිව් තලයේ මිස්සක පව්වට සදහම් පණිවිඩය සමඟ වැඩම කළ ඓතිහාසික දිනය පොසොන් දිනයයි.

## පෝය ලබන ගෙවෙන වේලාවන් සහ සිල් සමාදන් විය යුතු දවස්

| | | | |
|---|---|---|---|
| **දුරුතු** | | | |
| ජන 07 බ්‍රහස්. | පූ.භා 04.43 න් අව අටවක ලබා 08 සිකුරාද පූ.භා. 03.45 න් ගෙවේ. | 07බ්‍රහස්. | සිල් |
| ජන 14 බ්‍රහස්. | පූ.භා. 10.12 න් අමාවක ලබා 15 සිකු. අ.භා. 12.41 න් ගෙවේ. | 14 බ්‍රහස්. | සිල් |
| **නවම් -** | | | |
| ජන 23 සෙන. | පූ.භා. 04.07 න් පුර අටවක ලබා 24 ඉරිදද පූ.භා. 04.27 න් ගෙවේ | 23 සෙන. | සිල් |
| ජන 29 සිකුරා | අ.භා. 03.32 න් පසළොස්වක ලබා 30 සෙන.පූ.භා. 11.47 න් ගෙවේ. | 29 සිකු. | සිල් |
| පෙබ 05 සිකුරා. | අ.භා. 05.23 න් අව අටවක ලබා 06 සෙන. අ.භා. 05.25 න් ගෙවේ. | 05 සිකු. | සිල් |
| පෙබ 13 සෙන. | පූ.භා.05.41 න් අමාවක ලබා 14 ඉරිදද පූ.භා. 08.21 න් ගෙවේ. | 13 සෙන. | සිල් |
| **මැදින් -** | | | |
| පෙබ 21 ඉරිදද | අ.භා. 06.26 න් පුර අටවක ලබා 22 සඳුදද අ.භා. 05.47 න් ගෙවේ. | 22 සඳුදද | සිල් |
| පෙබ 28 ඉරිදද | පූ.භා. 01.50 න් පසළොස්වක ලබා 28 එදිනම අ.භා. 10.07 න් ගෙවේ. | 28 ඉරිදද | සිල් |
| මාර්තු 07 ඉරිදද | පූ.භා. 08.41 න් අව අටවක ලබා 08 සඳුදද පූ.භා. 09.53 න් ගෙවේ. | 07 ඉරිදද | සිල් |
| මාර්තු 15 සඳුදද | පූ.භා. 12.31 න් අමාවක ලබා 16 අඟ. පූ.භා. 04.07 න් ගෙවේ | 15 සඳුදද | සිල් |
| **බක් -** | | | |
| මාර්තු 23 අඟ. | පූ.භා.05.08 න් පුර අටවක ලබා 24 බදදද පූ.භා. 03.43 න් ගෙවේ. | 23 අඟ | සිල් |
| මාර්තු 29 සඳුදද | පූ.භා. 11.04 න් පසළොස්වක ලබා 30 අඟ. පූ.භා. 07.55 න් ගෙවේ. | 29 සඳුදද | සිල් |
| අප්‍රේල් 6 අඟ. | පූ.භා. 02.07 න් අව අටවක ලබා 07 බදදද පූ.භා. 04.14 න් ගෙවේ. | 06 අඟ. | සිල් |
| අප්‍රේල් 13 අඟ. | අ.භා. 05.11 න් අමාවක ලබා 14 බදදද අ.භා. 05.58 න් ගෙවේ. | 13 අඟ. | සිල් |
| **අධි වෙසක් -** | | | |
| අප්‍රේල් 21 බදදද | අ.භා. 12.46 න් පුර අටවක ලබා 22 බ්‍රහස්.පූ.භා. 10.48 න් ගෙවේ. | 21 බදදද | සිල් |
| අප්‍රේල් 27අඟහ. | අ.භා. 07.53 න් පසළොස්වක ලබා 28 බදදද අ.භා. 05.48 න් ගෙවේ. | 28 බදදද | සිල් |
| මැයි 05 බදදද | අ.භා. 08.30 න් අව අටවක ලබා 06 බ්‍රහස්. අ.භා. 11.00 න් ගෙවේ. | 06 බ්‍රහස්. | සිල් |
| මැයි 13 බ්‍රහස්. | පූ.භා. 07.08 න් අමාවක ලබා 14 සිකු. පූ.භා. 06.34 න් ගෙවේ. | 13 බ්‍රහස් | සිල් |
| **ශුද්ධ වෙසක් -** | | | |
| මැයි 20 බ්‍රහස්. | අ.භා. 06.18 න් පුර අටවක ලබා 21 සිකු. අ.භා. 04.06 න් ගෙවේ. | 21 සිකු. | සිල් |
| මැයි 27 බ්‍රහස්. | පූ.භා. 05.18 න් පසළොස්වක ලබා 28 සිකු. පූ.භා. 04.37 න් ගවේ. | 27 බ්‍රහස්. | සිල් |
| ජූනි 04 සිකුරා. | අ.භා. 02.32 න් අව අටවක ලබා 05 සෙන. අ.භා. 04.48 න් ගෙවේ. | 04 සිකු. | සිල් |
| ජූනි 11 සිකුරා. | අ.භා. 06.34 න් අමාවක ලබා 12 සෙන. අ.භා. 04.44 න් ගෙවේ. | 12 සෙන. | සිල් |
| **පොසොන් -** | | | |
| ජූනි 18 සිකුරා | අ.භා. 11.04 න් පුර අටවක ලබා 19 සෙන. අ.භා. 08.59 න් ගෙවේ. | 19 සෙන. | සිල් |
| ජූනි 25 සිකුරා. | අ.භා. 04.14 න් පසළොස්වක ලබා 26 සෙන. අ.භා. 05.00 න් ගෙවේ. | 25 සිකු. | සිල් |
| ජූලි 04 ඉරිදද. | පූ.භා. 07.13 න් අව අටවක ලබා 05 සඳුදද පූ.භා. 08.50 න් ගෙවේ. | 04 ඉරිදා | සිල් |
| ජූලි 11 ඉරිදද | පූ.භා. 04.04 න් අමාවක ලබා 12 සඳුදද පූ.භා. 01.10 න් ගෙවේ. | 11 ඉරිදද | සිල් |
| **ඇසළ -** | | | |
| ජූලි 18 ඉරිදද | පූ.භා. 04.31 න් පුර අටවක ලබා 19 සඳුදද පූ.භා. 02.58 න් ගෙවේ. | 18 ඉරිදද | සිල් |
| ජූලි 25 ඉරිදද | පූ.භා. 05.12 න් පසළොස්වක ලබා 26 සඳුදද පූ.භා. 07.07 න් ගෙවේ. | 25 ඉරිදද | සිල් |
| අගෝ 02 සඳුදද | අ.භා. 10.01 න් අව අටවක ලබා 03 අඟ. පූ.භා. 10.47 න් ගෙවේ' | 03 අඟ. | සිල් |
| අගෝ 09 සඳුදද | අ.භා. 12.15 න් අමාවක ලබා 10 අඟ. පූ.භා. 08.38 න් ගෙවේ | 09 සඳුදද | සිල් |
| **නිකිණි -** | | | |
| අගෝ 16 සඳුදද | පූ.භා 12.08 න් පුර අටවක ලබා 17 අඟ.පූ.භා. 11.31 න් ගෙවේ. | 16 සඳුදද | සිල් |
| අගෝ 23 සඳුදද. | අ.භා. 08.08 න් පසළොස්වක ලබා 24 අඟ. අ.භා. 10.35 න් ගෙවේ. | 24 අඟහ | සිල් |
| සැප් 01 බදදද. | පූ.භා. 10.51 න් අව අටවක ලබා 02 බ්‍රහස්. පූ.භා.10.42 න් ගෙවේ. | 01 බදදද | සිල් |
| සැප් 07 අඟ. | අ.භා. 07.53 න් අමාවක ලබා 08 බදදද අ.භා. 04.00 න් ගෙවේ | 08 බදදද | සිල් |
| **බිනර -** | | | |
| සැප් 14 අඟ. | අ.භා. 11.10 න් පුර අටවක ලබා 15 බදදද අ.භා. 11.42 න් ගෙවේ. | 15 බදදද | සිල් |
| සැප් .22 බදදද. | අ.භා 12.31 න් පසළොස්වක ලබා 23 බ්‍රහස්. අ.භා. 02.47 න් ගෙවේ. | 22 බදදද | සිල් |
| සැප් 30 බ්‍රහස්. | අ.භා. 09.47 න් අව අටවක ලබා 01 සිකු. අ.භා. 08.48 න් ගෙවේ. | 01 සිකු. | සිල් |
| ඔක් 07 බ්‍රහස්. | පූ.භා.03.50 න් අමාවක ලබා 08 සිකු.පූ.භා.00.14 න් ගෙවේ. | 07 බ්‍රහස්. | සිල් |
| **වප් -** | | | |
| ඔක් 14 බ්‍රහස්. | අ.භා. 02.13 න් පුර අටවක ලබා 15 සිකු. අ.භා. 03.51 න් ගෙවේ. | 14 බ්‍රහස්. | සිල් |
| ඔක් 22 සිකුරා | පූ.භා.05.35 න් පසළොස්වක ලබා 23 සෙන. පූ.භා. 07.07 න් ගෙවේ. | 22 සිකු. | සිල් |
| ඔක් 30 සෙන. | පූ.භා. 07.03 න් අව අටවක ලබා 31 ඉරිදද පූ.භා. 05.22 න් ගෙවේ. | 30 සෙන. | සිල් |
| නොවැ05 සිකුරා. | අ.භා. 01.02 න් අමාවක ලබා 06 සෙන. පූ.භා. 10.22 න් ගෙවේ. | 05 සිකු | සිල් |
| **ඉල් -** | | | |
| නොවැ 13 සෙන. | පූ.භා. 09.01 න් පුර අටවක ලබා 14 ඉරිදද පූ.භා. 11.21 න් ගෙවේ. | 13 සෙන. | සිල් |
| නොවැ 20සෙන. | අ.භා. 10.37 න් පසළොස්වක ලබා 21 ඉරිදද අ.භා. 10.57 න් ගෙවේ. | 21 ඉරිදද | සිල් |
| නොවැ 28ඉරිදද | අ.භා. 03.08 න් අව අටවක ලබා 29 සඳුදද අ.භා. 01.03 න් ගෙවේ. | 28 ඉරිදද | සිල් |
| දෙසැ 05 ඉරිදද | පූ.භා. 12.23 න් අමාවක ලබා එදිනම අ.භා. 11.06 න් ගෙවේ. | 05 ඉරිදද | සිල් |
| **උඳුවප් -** | | | |
| දෙසැ 13 සඳුදද. | පූ.භා. 06.12 න් පුර අටවක ලබා 14 අඟ. පූ.භා. 08.44 න් ගෙවේ. | 13 සඳුදද. | සිල් |
| දෙසැ 20 සඳුදද. | අ.භා. 02.48 න් පසළොස්වක ලබා 21 අඟ. අ.භා. 01.44 න් ගෙවේ. | 20 සඳුදද. | සිල් |
| දෙසැ 27 සඳුදද. | අ.භා. 10.52 න් අව අටවක ලබා 28 අඟ. අ.භා. 08.48 න් ගෙවේ. | 28 අඟ. | සිල් |

## දෙලොස් මහා පොහොය දිනවල සිදු වූ ශාසනික වශයෙන් වැදගත් ඓතිහාසික සිදුවීම්

**ඇසළ පසළොස්වක පොහොය**
බරණැස ඉසිපතනාරාමයේ දී දුකත්, දුකට හේතුවත් නිවනත් එය ලබන පිළිවෙතත් යන සත්‍ය සතර ලොවට පළමුවරට දේශනා කළ දිනයයි. ඇසළ පෝදා.

**නිකිණි පසළොස්වක පොහොය**
ඇසළ අව පෑළවිය ද භික්ෂූන් වහන්සේ පෙර වස් එළඹීමට නියමිත දිනයයි. නිකිණි පසළොස්වක පොහෝද පොහොය කොට නිකිණි අව පෑළවිය ද පසු වස් එළඹීමයි. සසුන් පිළිවෙත වන්නේ.

**බිනර පසළොස්වක පොහොය**
බුද්ධ නියමය අනුව භික්ෂූන් වහන්සේ විහාරාරාමයන්හි නිබඳව වැඩ වසමින් බණ භාවනාවල යෙදෙමින් ස්වකීය ශාසන පරමාර්ථ ඉටු කර ගන්නා කාලයකි. මෙහෙණි සසුනේ ආරම්භය සිදු විය.

**වප් පසළොස්වක පොහොය**
වස්සාන සෘතුවේ මුල් තුන් මස භික්ෂූන් වස් වසා වැඩ සිටින කාලයයි. වස් සාර මාසයේ අන්තිම මාසය කඨින චීවර පූජා මාසයයි. එය චීවර මාසය නමින් ද ව්‍යවහාර කැරේ.

**ඉල් පසළොස්වක පොහොය**
ශාසන ඉතිහාසයේ අනුස්මරණීය සිද්ධීන් කීපයකට මුල් වූ පොහොය දිනයකි. මෙතේ බෝසත්තුමා විවරණ ලැබීම, ප්‍රථම රහතන් වහන්සේ හැට නම ධර්ම ප්‍රචාරය සඳහා ගමන් ඇරඹීම පසු වස් පවාරණය කළ යුතු දිනය ද, සැරියුත් මහරහතන් වහන්සේගේ පරිනිර්වාණය සිදුවීමද යන කරුණු රැසක් අනුස්මරණය කැරෙන්නේ ඉල් පෝදා ය.

**උඳුවප් පසළොස්වක පොහොය**
උඳුවප් පොහොය දින සිදු වූ ශ්‍රී සංඝමිත්තා මහරහත් මෙහෙණින් වහන්සේගේ ලංකාගමනය ගැන ලංකා මෙහෙණි සසුන ගැන, ජය ශ්‍රී මහා බෝසමිඳුන් ගැන සිහි කරන කවර අයකුට වූවද ඇති වනුයේ මහා සැනසිල්ලකි.

සිතුවම -
සරත් නන්ද කුමාර

ඇපා
පඤ්චාංග
ලිතෙනි